**13-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ ශ්‍රීමත් අනුගමනය කර, මුළු ලෝකය සහ පදාර්ථ පිවිතුරු කිරීම සඳහා ඒවාට සේවය කළ යුතුයි. සියලු දෙනාටම සතුට සහ සාමය වෙතට මාර්ගය පෙන්වන්න.

**ප්‍රශ්නය:** තමන්ගේම සිරුරු පවා අමතක කිරීමට ඔබ උත්සාහ දරන නිසා, ඔය දරුවන්ට අවශ්‍ය නොවන්නේ කුමක්ද?

**පිළිතුර:** පිංතූර. ඔබගේ රූපය (සිරුර) ඔබ අමතක කළ යුතු නිසා, ඔබට එම පිංතූර අවශ්‍ය වන්නේ ඇයි? තමන් ජීවාත්ම බව සලකා, අශාරීරික පියාව සහ ඔබගේ මිහිරි නිවහන සිහි කරන්න. මෙම පිංතූර තිබෙන්නේ කුඩා දරුවන්ටයි එනම්, අළුත් අයටයි. ඔබ සිහිපත් කිරීමේ හිඳිමින් අන් අයට සිහි කිරීමේ සිටීමට දිරි ගැන්විය යුතුයි. ඔබගේ ව්‍යාපාර වල යෙදෙමින් සතෝප්‍රධාන් වීම සඳහා සිහි කිරීමේ සිටීමට පුහුණු වන්න.

**ගීතය:** මගේ භාග්‍යය අවදි කරමින් මා පැමිණ ඇත.

ඕම් ශාන්ති. සුමිහිරි දරුවනේ, ඔබ මෙම ගීතය ඇසූ සැනින් ඔබ මත සතුටේ හිරිගඩු පිපුණි. ඔබ මෙහි පැමිණ ඇත්තේ ඔබගේ භාග්‍යය, ඔබගේ දිව්‍ය ලෝකයේ භාග්‍යය හිමි කරගැනීමට බව ඔය දරුවන් දන්නවා. වෙනත් කිසිම තැනක මෙය නොකියයි. පියාගෙන් ඔබගේ දෙව්ලොව උරුමය, ඔබ හිමි කරගන්නා බව ඔබ දන්නවා එනම්, ඔබ දෙව්ලොව නිර්මාණය කිරීමට උත්සාහ දරමින් සිටිනවා. ඔබ දෙව්ලොව වැසියන් වීමට පමණක් උත්සාහ දරනවා නොවෙයි, නමුත් දිව්‍ය ලෝකයේ උසස්ම උසස් තත්ත්වය හිමි කරගැනීමටත්ය. දිව්‍ය ලෝකයේ දර්ශන ලබා දෙන පියා, අපට දැන් උගන්වනවා. ඔය දරුවන් තුළ මෙම කුල්මත් බව තිබිය යුතුයි. භක්තිය දැන් අවසන් වනවා. ඔවුන් රාවනගේ දම්වැල් වල සිරවී ඇති නිසා, පරමාත්ම දෙවියන්, බැතිමතුන්ව ඉහළ නැංවීමට පැමිණෙන බව කියැවෙයි. සියලු දෙනාටම විවිධ අදහස් තිබෙන, මනුෂ්‍යයන් බොහෝ දෙනෙක් සිටියි. ලෝක චක්‍රය, සදාතනිකව පැවතෙන නාටකයක් බව ඔබට දැනගන්නට ලැබී තිබේ. ඔවුන් පෞරණික නව ලෝකයේ වැසියන්ව සිටි බවත් ඔවුන් දැන් පැරණි ලෝකයේ වැසියන් වී ඇති බවත් භාරතයේ මිනිසුන්ට වැටහෙනවා. පරම පියා, දෙව්ලොව, නව ලෝකය, නිර්මාණය කළ අතර ඉන්පසුව රාවන, එය අපාය බවට පත් කළා. බාප්දාදාගේ උපදෙස් පිළිපැදීමෙන් ඔබ දැන් තමන් වෙනුවෙන් නව ලෝකය නිර්මාණය කරගන්නවා. ඔබ ඉගෙනගන්නේ නව ලෝකය වෙනුවෙන්ය. ඔබට උගන්වන්නේ කවුද? ඥාන සාගරය, පාරිශුද්ධකරු, ප්‍රශංසා කෙරෙන ඒකායන කෙනාය. ඒකායන කෙනාගේ හැර, වෙනත් කිසිම කෙනෙකුගේ ප්‍රශංසා ගායනා කළ නොහැක. පාරිද්ධකරු ඔහුම පමණයි. අප සියලු දෙනාම අපවිත්‍රයි. කිසිවෙක් පිවිතුරු ලෝකය සිහි නොකරයි. වසර 5000කට පෙර, සැබවින්ම නව ලෝකය තිබුණු බව ඔබට දැන් වැටහෙයි. තිබුණේ මෙම භාරතය පමණයි. අන් සියලු ආගම් සිටියේ සාමයෙනි. භාරතයේ නිවැසියන් වන අප සිටියේ සතුටු දේශයේ. මිනිසුන්ට සාමය අවශ්‍ය නමුත් කිසි කෙනෙකුට මෙහි සාමයෙන් සිටිය නොහැක. මෙය, සාම දේශය නොවෙයි. අප පැමිණෙන්නේ, එහි අශාරීරික ලෝකයේ සිටයි. සත් යුගය, සතුටු දේශයයි එය සාම දේශය ලෙස හැඳින්විය නොහැක. එහිදි ඔබ පිවිතුරුව, සාමයෙන් සහ සතුටින් සිටියි. එහි කිසිම කැලඹිල්ලක් නැත. දරුවන් නිවසේ කලබල ඇති කරන විට ඔවුන්ට නිහඬවන්නට කියයි. පරම පියා පවසන්නේ ඔය ජීවාත්ම එම සාම දේශයට අයත් වූ අතර ඉන්පසුව ඔබ මෙම කලහකාරී දේශයට පැමිණියා. මෙය ඔබගේ බුද්ධිය තුළ ඇත. ඔබ නැවත වරක් පරම පියාගෙන් උසස්ම උසස් තත්ත්වය හිමි කරගැනීමට උත්සාහ දරනවා. මෙම පාසැලද අඩු නැහැ. මෙය පරමාත්ම දෙව් පියාණන්ගේ විශ්වවිද්‍යාලයයි. මුළු ලෝකයෙන්ම විශාලතම විශ්වවිද්‍යාලය මෙයයි. මෙහිදි, සියලු දෙනාම ඔවුන්ගේ සාමය සහ සතුටේ උරුමය පරම පියාගෙන් හිමිකරගනී. පරම පියා හැර වෙනත් කිසිවෙකුගේ වර්ණනාවක් නැත. බ්‍රහ්මගේ වර්ණනාවක් නැත. මෙකල පැමිණ, ඔබට උරුමය ලබා දෙන්නේ ඒකායන පියා පමණයි. ඉන්පසුව සතුට, සතුටම පමණක් තිබෙයි. ඔබට සාමය සහ සතුට ලබා දෙන්නේ ඒකායන පියා පමණයි. වර්ණනාව තිබෙන්නේ ඔහු ගැන පමණයි. ස්වර්ණමය සහ රිදී යුගයේ කිසිවෙකුගේ වර්ණනාවක් නැත. එහි රාජධානිය පැවතෙයි. ඔබ ඔබගේ උරුමය හිමි කරගන්නා අතර ඉතිරි සියලු දෙනා සාම දේශයේ සිටියි. කිසිවෙකුගේ වර්ණනාවක් නැත. ක්‍රිස්තුස් වහන්සේ ආගමක් ස්ථාපිත කරන නමුත්, ඔහු එය කළ යුතුයි. ඔහු ආගමක් ස්ථාපිත කරන නමුත් ඔහු ඒ තිබියදි පහළට පැමිණෙයි. එබැවින් ඇති වර්ණනාව කුමක්ද? තිබෙන්නේ, පාරිශුද්ධකරු සහ විමුක්තිදායක

ලෙස හැඳින්වෙන ඒකායන කෙනාගේ වර්ණනාව පමණයි. ඔහු ක්‍රිස්තුතුමාව හෝ බුදුරදුන් ආදින්ව සිහි කරන්නේ නැත. ඒකායන පරමාත්ම දෙවියන්ව, පියාව, සිහි කරන්නේ ඔවුන්ය. ස්වර්ණමය යුගයෙදි කිසිවෙකුව වර්ණනා කෙරෙන්නේ නැත. පසුව ආගම් ආරම්භ වූ විටයි, මිනිසුන් පරම පියාගේ ප්‍රශංසා ගායනා කර, භක්තිය ඇරඹෙන්නේ. නාටකය නිර්මාණය වන්නේ කෙසේද? චක්‍රය නොකඩවා භ්‍රමණය වන අන්දම වැටහෙන්නේ පරම පියාගේ දරුවන් වන අයට පමණයි. නිර්මාණකරු පියාය. ඔහු දිව්‍ය ලෝකයේ නව ලෝකය නිර්මාණය කරයි. කෙසේවෙතත්, සියලු දෙනාටම දෙව්ලොව යා නොහැක. නාටකයේ වැදගත්කමද වටහාගත යුතුයි. ඔබගේ සතුටේ උරුමය ඔබට හිමි වන්නේ පරම පියාගෙනි. මෙකල සියලු දෙනාම සිටින්නේ දුකෙන්ය. සියලු දෙනාම ආපසු නිවසට යා යුතු අතර ඉන්පසුව සතුට තිබෙයි. ඔය දරුවන්ට ඉතා හොඳ චරිත කොටස් ලැබී ඇත. බොහෝ සේ වර්ණනා කර ඇති පරම පියා, දැන් පැමිණ ඔය දරුවන් ඉදිරියේ අසුන් ගෙන ඔබට විස්තර කර දෙයි. ඔබ සියලු දෙනාම දරුවන්ය. පරම පියා සදා සතුටින් සිටියි. ඇත්ත වශයෙන්ම පියා ගැන ඔබට මෙය කිව නොහැක. ඔහු සතුටට පත් වන්නේ නම්, එවිට ඔහු දුකටද පත් වෙයි. බාබා ඒ සියල්ල ඉක්මවා සිටියි. පරම පියාගේ වර්ණනාව මෙකල්හි ඔබගේද වර්ණනාවයි. පසුව අනාගතයේ ඔබගේ වර්ණනාව වෙනස් වෙයි. පියා, ඥාන සාගරය වනවා සේම ඔබද එය වේ. කල්ප චක්‍රය පිළිබඳ දැනුම ඔබගේ බුද්ධිය තුළ තිබේ. පරම පියා සතුටු සාගරය බවත් ඔහුගෙන් ඔබට බොහෝ සතුට ලැබෙන බවත් ඔබ දන්නවා. මෙකල පියාගෙන් ඔබට ඔබගේ උරුමය හිමි වනවා. ශ්‍රේෂ්ඨ ක්‍රියා සිදු කරන්නේ කෙසේද කියා, පියා ඔබට මෙකල උගන්වයි. ඒ ආකාරයෙන්ම මෙතරම් උසස් තත්ත්වයක් හිමි කරගැනීමට, මේ ලක්ෂ්මී සහ නාරායන ඔවුන්ගේ පෙර භවයේ බොහෝ හොඳ ක්‍රියා අනිවාර්යෙන් සිදුකරන්නට ඇති. ඔවුන් තම රාජධානිය හිමි කරගත්තේ කෙසේද කියා ලෝකයේ කිසිවෙකුට වැටහෙන්නේ නැත. පියා පවසන්නේ ඔය දරුවන් දැන් මෙවන් අන්දමට පත් වනවා. ඔබ ශ්‍රේෂ්ඨව සිටි බවත් ඔබ නැවත වරක් ඒ අන්දමට පත් වන බව ඔබගේ බුද්ධියට ඇතුළු වෙයි. පියා මෙහි අසුන්ගෙන, එය තුළින් ඔබ මෙය බවට පත්වන, කර්ම, අකර්ම සහ විකර්මයේ න්‍යාය ඔබට පහදා දෙයි. ඔහු ඔබට ශ්‍රීමත් ලබා දෙන බැවින් ඔබ ශ්‍රීමත් වටහාගත යුතුයි. ශ්‍රීමත් සමගින්, ඔහු පංච මහා භූත ආදිය ඇතුළුව මුළු ලෝකයම ශ්‍රේෂ්ඨත්වයට පත් කරවයි. ස්වර්ණමය යුගයේ සෑම කෙනෙක් සහ සෑම දෙයක්ම ශ්‍රේෂ්ඨයි. කිසිදු ආකාරයක කැලඹිල්ලක් හෝ කුණාටු නොමැත. වැඩි උෂ්ණයක් හෝ වැඩි සීතලක් නැත එහි සෑම විටම වසන්තයයි. එහිදී ඔබ බොහෝ සතුටින් රැඳී සිටියි. පරමාත්ම දෙවියන් (කුදා) දෙව්ලොව (බාහිස්ත්) ස්ථාපිත කරන බව ඒ මිනිසුන් ගායනා කරයි. එබැවින් ඔබ උසස් තත්ත්වයක් හිමි කරගැනීමට උත්සාහ දැරිය යුතුයි. සෑම විටම සිහි කෙරෙන්නේ මව සහ පියාව අනුගමනය කරන්න. ඔබ පරම පියා සිහි කරන විට ඔබගේ පාපයන් දුරුවෙයි. ජීවාත්ම වන අප දැන් පරම පියා සමග පෙරලා නිවහනට යාමට නියමිතයි. ශ්‍රීමත් අනුගමනය කර සියලු දෙනාටම මාර්ගය පෙන්වන්න. අසීමිත පියාණන් දෙව්ලොවෙහි නිර්මාණකරුයි. දැන් එය අපායයි. ඔහු දෙව්ලොව උරුමය ලබා දෙන්නට ඇත්තේ නියත වශයෙන්ම අපායේදිය. අප දැන් අපගේ උපත් 84 අවසන් කරන අතර ඉන්පසුව අපගේ ප්‍රථම උපත අප දෙව්ලොවේදී ගනී. ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ තිබේ. ඔබ පත් විය යුත්තේ මෙය බවටයි. අප නැවත වරක් ලක්ෂ්මී සහ නාරායන මෙන් වනවා. ඇත්ත වශයෙන්ම මෙම පිංතූර වලට අවශ්‍යතාවයක් නැත. දුර්වල අයට නැවත නැවතත් මෙය අමතක වෙයි, පිංතූර තබා ඇත්තේ මේ නිසයි. සමහරු ක්‍රිෂ්ණාගේ පිංතූර පවා තබාගනී ඔහුව නොදැක ඔවුන්ට ක්‍රිෂ්ණා සිහි කළ නොහැක. සෑම කෙනෙකුගේම බුද්ධිය තුළ පිංතූරයක් තිබේ. ඔබ පිංතූර එල්ලා තැබීමට අවශ්‍ය නැත. තමන් ජීවාත්ම බව සලකන්න. තමන්ගේම රූපයද ඔබ අමතක කළ යුතුයි. තමන්ගේ සිරුර සමග සම්බන්ධය ඇතුළුව ඔබ සියලු සම්බන්ධකම් අමතක කළ යුතුයි. පරම පියා පවසන්නේ ඔබ ඒකායන පෙම්බරයාගේ ආදරවන්තයින්ය. පෙම්බර පියාණන් පවසන්නේ ඔබගේ පාපයන් දුරු වන සේ අඛණ්ඩව මාව සිහි කරන්න. ඔබ තම සිරුර අත්හැර යන විට, ඔබ මෙම පැරණි ලෝකය දමා, පරම පියා වෙතට යන බව ඔබට වැටහෙන අන්දමේ, එවන් ප්‍රීතියක් ඔබට තිබිය යුතුයි. ඔබගේ උපත් 84 දැන් අවසන් වී ඇති අතර ඔබ දැන් පෙරලා යා යුතුයි. බාබා ඔබට නියම කර තිබෙන්නේ මා සිහි කරන්න! එපමණයි. පියා සහ මිහිරි නිවහන පමණක් සිහි කරන්න. ඔබ අශාරීරික ජීවාත්මව සිටි බවත් ඉන්පසුව ඔබගේ චරිත කොටස් රඟපෑමට මෙහි ආ බවත් එබැවින් ඔබ සිරුරු හදා ගත් බවත් ඔබගේ බුද්ධිය තුළ ඇත. ඔබගේ චරිත කොටස් රඟපාන අතර ඔබ අපවිත්‍ර විය. මෙම සිරුර පරණ සපත්තුවකි. ජීවාත්මය දැන් පිවිතුරු වනවා. මෙහි පිවිතුරු සිරුරක් ලබා ගත නොහැක. ජීවාත්ම වන අප දැන් ආපසු නිවහනට යා යුතුයි. ප්‍රථමයෙන් අපි රජ කුමරුන් සහ රාජ කුමාරියන් වන අතර ඉන්පසුව විවාහයෙන් පසුව අප ලක්ෂ්මී සහ නාරායන වෙයි. රාධේ සහ ක්‍රිෂ්ණා කවරෙක්ද කියා මිනිසුන් නොදනී. ඔවුන් දෙදෙනා වෙන් වූ රාජධානි දෙකකින් පැමිණි අතර ඉන්පසුව ඔවුන් විවාහ විය. සමහර දරුවන් ධ්‍යානයකට සමවැද, විවාහ උත්සවය දැක තිබේ. ආරම්භක

කාලයේ එම කොටස ඔබව පකිස්ථානයේදී සතුටින් තැබූ බැවින්, ඔබට බොහෝ දර්ශන ලැබුණි. අවසානයේ හිංසාකාරී ක්‍රියා පමණක් තිබෙයි. බොහෝ භූමිකම්පා ඇති වෙයි. ඔබට නොකඩවා දර්ශන ලැබෙයි. ඔබ කුමන තත්ත්වයක් හිමි කරගන්නේද කියා ඔබ සෑම කෙනෙකුටම දැනගන්නට ලැබෙයි. ඒ වෙලාවේ අඩුවෙන් ඉගෙන ගෙන ඇති අය බොහෝ පසුතැවිලි වෙයි. පියා මෙසේ කියයි ඔබ ඉගෙනගත්තෙත් නැහැ, වෙන අයට ඉගැන්නුවේද නැහැ. ඔබ සිහි කිරීමේ සිටියේද නැත. ඔබට සතෝප්‍රධාන් විය හැක්කේ සිහි කිරීම තිබීමෙන් පමණයි. පාරිශුද්ධකරු වන්නේ පියා පමණයි. ඔහු පවසන්නේ නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න, එවිට ඔබ තුළ ඇති මිශ්‍ර ලෝහ ඉවත් වෙයි. ස්මරණ වන්දනාවේ සිටීමට උත්සාහ දැරිය යුතුයි. ඔබට ඔබගේ ව්‍යාපාර කටයුතු ආදිය දිගටම කළ හැක. ක්‍රියා සිදුකළ යුතුයි, නමුත් ඔබගේ බුද්ධියේ යෝගාව එහි සම්බන්ධ වී තිබිය යුතුයි. ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් විය යුත්තේ මෙහිදිය. ඔබගේ පවුලේ අය සමග නිවසේ වාසය කරන අතර මා සිහි කරන්න, මන්ද ඔබ නව ලෝකයේ පාලකයන් බවට පත් වන්නේ එවිට පමණයි. පරම පියා ඔබට වෙනත් කිසිදු අපහසුතාවයක් නොදෙයි. ඔහු ඔබට ඉතා පහසු ක්‍රමවේදයක් පෙන්වයි. සතුටු දේශයේ පාලකයෙක් වීම සඳහා නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න. දැන් ඔහුව පමණක් සිහි කරන්න බාබාද තාරකාවක්. ඔහු සර්ව බලධාරියා නිසා, ඔහු බොහෝ දීප්තිමත් බව, මිනිසුන් විශ්වාස කරයි. පරම පියා පවසන්නේ මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ ජීවමාන බීජය මමයි, මා බීජය නිසා මා මුල, මැද සහ අවසානය ගැන දන්නවා. ඔබ බීජ නොවෙයි. මා බීජයයි, මේ නිසයි ඥාන සාගරය ලෙස මා හැඳින්වෙන්නේ. ඔහු මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ ජීවමාන බීජයයි, එබැවින් ලෝක චක්‍රය අඛණ්ඩව භ්‍රමණය වන්නේ කෙසේද කියා ඔහු නියත වශයෙන්ම දන්නවා. ඍෂිවරු සහ මුණිවරු නිර්මාණකරු හෝ නිර්මාණයේ මුල, මැද හෝ අවසානය ගැන නොදනී. දරුවන් මෙය දැන සිටියේ නම්, ඔවුන්ට ඔහු වෙත යාමට වැඩි කාලයක් ගත නොවනු ඇත. කෙසේවෙතත්, පරම පියා වෙතට මාර්ගය කිසි කෙනෙක් නොදනී. අපවිත්‍ර අය පිවිතුරු ලෝකයට යන්නේ කෙසේද? පියා මෙසේ පවසන්නේ මේ නිසයි විශාලතම සතුරා වන රාගය පරාජය කරන්න! එය ආරම්භ වන කාලයේ සිට මැද හරහා අවසානය දක්වාම ඔබට දුක ඇති කරයි. ඔහු ඔය දරුවන්ට ඉතා හොඳින් විස්තර කරයි. අපහසුතාවයක් නැත. ඔබට තිබෙන්නේ පරම පියා සහ උරුමය සිහි කිරීම පමණයි. පියාව සිහි කිරීමෙන්, එනම්, යෝගාවේ සිටීමෙන්, ඔබගේ පාපයන් පිළිස්සී යයි. තත්පරයකදී ඔබට පියාගෙන් ආධිපත්‍යය හිමි වෙයි. ඔය දරුවන් දෙව්ලොව යන නමුත් එහිදී උසස් තත්ත්වයක් හිමි කරගැනීමට ඔබ උත්සාහ දැරිය යුතුයි. ඔබ දෙව්ලොව යා යුතුයි. ටිකක් සවන් දීමෙන් වුවද පරම පියා පැමිණ ඇති බව මිනිසුන්ට වැටහෙයි. දැන් වුවද, එය එම මහා භාරත යුද්ධයමයි, කියා මිනිසුන් කියයි. ඔය දරුවන්ට රාජ යෝගාව ඉගැන්නුවේ අනිවාර්යෙන්ම පියා විය යුතුයි. ඔබ සියලු දෙනාව නොකඩවා අවදි කරයි. බොහෝ දෙනෙක්ව අවදි කරන අයට උසස් තත්ත්වයක් ලැබෙයි. උත්සාහයන් දැරිය යුතුයි. සෑම කෙනෙකුටම එකම ආකාරයේ උත්සාහ දරන්නෙක් විය නොහැක. මෙය ඉතා වැදගත් පාසැලකි. මෙය ලෝක විශ්ව විද්‍යාලයයි. මුළු ලෝකයම සතුටු දේශය සහ සාම දේශය බවට පත් කළ යුතුයි. ඔබ එවන් ගුරුවරයෙක්ව කිසිදා දැක තිබෙනවාද? මුළු ලෝකය, විශ්වය ලෙස හැඳින්වෙයි. විශ්වයේ සියලුම මනුෂ්‍යයන්ව සතෝප්‍රධාන් කරවන්නේ පරම පියා පමණයි එනම්, දෙව්ලොව නිර්මාණය කරන්නේ ඔහු පමණයි. භක්ති මාර්ගයේ සමරන සියලුම උත්සව වලින් හැඳින්වෙන්නේ මේ කාලය, සංගම යුගය ගැනයි. ස්වර්ණමය සහ රිදී යුගයන්හි උත්සව නොමැත. එහි, ඔවුන් අත්විඳින්නේ ප්‍රතිලාභය පමණයි. සියලුම උත්සව සමරන්නේ මෙහිදිය. හෝලි සහ දූරියා, දැනුමේ කාරණාය. උත්සව සැමරෙන්නේ අතීතයේ සිදුවූ සියලු දේවල් පිළිබඳවයි, නමුත් ඒවා සැබවින්ම අයත් වන්නේ මේ කාලයටයි. හෝලි වලින් හැඳින්වෙන්නේ මේ කාලය ගැනයි. සෑම දෙයක්ම නිම කෙරෙන්නේ චක්‍රයේ අවසන් වසර 100 තුළයි. ලෝකය පවා අළුත් වෙයි. ඔබ බොහෝ වාර ගණනාවක් ඔබගේ දෙව්ලොව උරුමය හිමි කරගෙන ඉන්පසුව එය අහිමි කරගත් බව ඔබට වැටහෙයි. ඔබ නැවත වරක් පියාගෙන් ඔබගේ උරුමය හිමි කරගන්නා බවට සතුට ඔබට තිබේ. ඔබ අන් අයටද මාර්ගය පෙන්විය යුතුයි. නාටකයට අනුව දිව්‍ය ලෝකය නියත වශයෙන්ම ස්ථාපිත විය යුතුයි. දිවා කාලයට පසුව රාත්‍රියත් රාත්‍රියට පසුව දහවලත් තිබෙන අයුරින් කලි යුගයට පසුව අනිවාර්යෙන් සත් යුගය තිබිය යුතුයි. ඔය මිහිරිතම දරුවන්ගේ බුද්ධි තුළ සතුටේ බෙර හඬ වාදනය විය යුතුයි. කාලය දැන් අවසානයකට පැමිණෙන අතර අපි සාම දේශයට යනවා. මෙය අවසන් උපතයි. කර්මයේ විඳවීමද සතුට සමග සැහැල්ලු වනවා. සමහර කර්මික ගිණුම් විඳවීම තුළින්ද, ඇතැම් ඒවා යෝගා බලයෙන්ද පියවිය යුතුයි. පරම පියා ඔබට ඉවසීම ලබා දෙයි. ඔබගේ නිරන්තර සතුටේ දින පැමිණෙනවා. ඔබගේ සිරුරුවල ජීවිකාව වෙනුවෙන් ඔබට මුදල් අවශ්‍ය නිසා ඔබගේ ව්‍යාපාර ආදිය ඔබ දිගටම කරගෙන යා යුතුයි. ව්‍යාපාරිකයන් පිංකම් වෙනුවෙන් යමක් පසෙක තබන බව, බාබා විස්තර කර දී තිබෙනවා. ඔවුන් බොහෝ ධනය රැස් කරන්නේ නම්, ඔවුන්ට තව බොහෝ දන් දීමට හැකි වන බව ඔවුන්

විශ්වාස කරයි. මෙහිදීද පියා විස්තර කරන්නේ කෙනෙක් පැන්ස දෙකක් දුන්නත් ඔහුට උපත් 21කට ප්‍රතිලාබය ලෙස විශාල වශයෙන් ආපසු ලැබෙයි. පෙර ඔබ දන් දී කළ පිංකම් වෙනුවෙන් ඔබගේ මතු භවයෙදි ප්‍රතිලාභය ලබා ගත්හ. දැන් ඔබ උපත් 21කට ප්‍රතිලාභය හිමි කරගනී. පෙර ඔබ පූජකයන් සහ මුණිවරුන්ට දන් දුන්නා. සෑම දෙයක්ම විනාශ වීමට යන බව, ඔබට දැන් වැටහෙයි. මා දැන් ඔබ ඉදිරියට පෞද්ගලිකවම පැමිණ සිටිනවා. එබැවින් සෑම දෙයක්ම මෙම කාර්යය වෙනුවෙන් භාවිත කරන්න, එවිට උපත් 21කට ඔබට උරුමය හිමි වෙයි. පෙර ඔබ ලබා දුන්නේ වක්‍රවයි, නමුත් දැන් ඔබ ඍජුවම ලබා දෙයි. ඔබගේ ඉතිරි සියලු දේම විනාශ වීමට යනවා. බාබා නොකඩවා ඔබට පවසන්නේ ඔබට මුදල් තිබෙනම්, මධ්‍යස්ථාන විවෘත කරන්න. මෙම වදන් පමණක් ලියන්න සත්‍ය ගීතා පාඨශාලාව. පරමාත්ම දෙවියන් පවසයි නිරන්තරයෙන් මා පමණක් සහ ඔබගේ උරුමය සිහි කරන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැතිවී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියා ගෙන් අධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියා මෙන්ම වර්ණනාවට සුදුසු වීම සඳහා පියාව අනුගමනය කරන්න.
2. මෙය අවසන් උපතයි. ඔබ දැන් ආපසු නිවහනට යා යුතුයි. එබැවින් සතුටේ බෙර හඬ ඔබ තුළ වාදනය විය යුතුයි. කර්මයේ සියලුම විඳවීම් කර්මයෝගාව තුළින් එනම්, පියාව සිහි කිරීමෙන් පියවන්න.

**වරදානය:** ඔබට මාස්ටර් සහ දරුවෙකු වීමේ අවධානය ඇති වී සියලු ලබා ගැනීම් වලින් පිරී සියලු නිධානයන්ට අයිතියක් ලැබේවා.
ඔබ පරම පියාගේ සියලු වස්තු වල දරුවන් සහ මාස්ටර්ස්, ස්වාභාවික යෝගීන් සහ ස්වාභාවික ස්වයං-ස්වාධීනයන් වේ. මෙම අවධානය තිබීමෙන් සියලු ලබා ගැනීම් වලින් පිරී යන්න. "මට ලබා ගැනීමට අවශ්‍ය දේ මම සාක්ෂාත් කර ගත්තා" යන ගීතය නිරන්තරයෙන් ගායනා කරන්න. අහිමි වීම සහ සොයා ගැනීම, අහිමි වීම සහ සොයා ගැනීම යන ක්‍රීඩාව නොකරන්න. "මම ලබනවා, මම ලබනවා" යනු අයිතියක් ඇති අයගේ වචන නොවේ. පූර්ණ පරමාත්ම පියාණන්ගේ දරුවන්, සාගරයේ දරුවන්, සේවකයින් මෙන් වෙහෙස මහන්සි වී වැඩ කිරීමට සිදු නොවිය යුතුය.

**පාඨය:** යෝගා බලයෙන් කර්ම දුක් විඳීමෙන් ජයග්‍රහණය ලබා ගැනීම යනු උසස් උත්සාහයක් දැරීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

පළමුවෙන්ම, ඔබට ඔබ කෙරෙහි පූර්ණ විශ්වාසයක් තිබිය යුතුය. එවිට, ඔබ බාප්දාදාට සහ මුළු පවුලේ ජීවාත්මයන්ට විශ්වාසවන්ත විය යුතුය. ඔබ විශ්වාසවන්තව සිටින විට සහ ඔබ කරන සෑම දෙයක් කෙරෙහිම ඔබේ බුද්ධිය විශ්වාස කරන විට, විශ්වාසවන්ත වීම නිසා, ඔබත් සාර්ථක වනු ඇත. විශ්වාසවන්ත වීමෙන්, සෑම කාර්යයක්ම, සෑම සිතුවිල්ලක්ම සහ සෑම වචනයක්ම බලවත් වනු ඇත.